කෙටිකතාව

ජයතිලක කම්මැල්ලවීර



# ඇබින්දක් වෙනස් කළ ඇත්ත කතාවක්

මොරටු විශ්වවිද්‍යාලයේ සාහිත්‍ය සංවාදය ආරම්භ වීමට නියමිතව තිබුණේ සවස පහට වුවද රාත්‍රී අට පසු වන තුරුත් එය පටන් ගන්නට වැස්ස ඉඩ නොදුන්නේය. ධාරාණිපාත වර්ෂාව අනපේක්ෂිතව කඩාපාත් වූවකි. මගුල් ගෙදරකට මදවියෙකු කඩා වැදුනු කලෙක මෙන් සංවිධායකයෝ අන්ද මන්ද වී සිටියහ. මාස ගණනක් සැලසුම් කර, දින ගණනක් වෙහෙසවී විශ්වවිද්‍යාල එළිමහන් රංගපීඨයේ කෙරුණු සැරසිලි සේදී ගොස් ඇත්තේ ඒවාට වෙහෙසුණු තරුණ සිසුන්ගේ මුහුණුද හොඳපාළු කරමිනි. ඔවුන්ගේ මුහුණුවල හත් දෙහේ වැහි අඳුරට වැඩි අඳුරකි. ඒවා දකින විට සංවාදය ඇරඹීමේ ප්‍රමාදය ගැන දෙස් කියන්නට නොසිතිණ. එහෙත් මේ වැඩේ අවසන්කර රෑ කීයට ආපසු ගෙදර යන්නේද යන ප්‍රශ්නය මගේ සිත කොනහන්නට පටන් ගෙන තිබුණෝය.

මේ ආරාධනය බාර ගන්නා විටද මා සිටියේ යහපත් සෞඛ්‍ය තත්වයක නොවේ. එහෙත් සංවාදයේ මාතෘකාව ඇසූ විට එය බාර ගත යුතු යයි මට සිතිණ. 'සංවේදී පුරවැසියකු බිහි කර ගැනීමට සාහිත්‍යයෙන් ලැබිය හැකි පිටිවහල'. අප රටේ මේ යුගයේ සංවේදීකම ගැන කතා කරන්නට තරුණ සිසුන් යොමු වීමම අරුමයකි. එවැනි දුර්ලභ කටයුත්තකට සහයෝගය දීම සංවේදී සාහිත්‍යකරුවන් හැටියට අපේ යුතුකමක් යැයි මට සිතිණ.

''මාර රස්තියාදුවක් නේද?'' මා සමග සංවාදයට සහභාගීවීමට පැමිණ සිටි කවියා ජයදේව තම නොඉවසිල්ල ප්‍රකාශ කළේ මට පමණක් ඇසෙන්නටය.
''වැස්ස තමයි ඔක්කොම අවුල් කළේ'' ඔහු අස්වසන්නටත් මගේ සිත අස්වසා ගන්නටත් මම කීවෙමි.

''ඒක තමයි හිතපු නැති වැස්සක්නෙ කඩා වැටුනෙ....'' ඔහු සන්සුන් වූවා සේ පෙනිණ. එහෙත් මොහොතකින් ඔහුගේ හඬ කෙඳිරිල්ලක් සේද චෝදනාවක් සේ ද ඇසිණ. ''දැන්නම් පටන් ගන්න පුළුවන්. මේ ළමයි මොනව කරනවද මන්ද''

ඔහු පැමිණ සිටින්නේ කුරුණෑගලිනුත් සැතපුම් කීපයක් ඈත සිට බව මට මතක් විය.

''බස් එකේද ආවෙ?''
''ඔව්''
'රෑ වෙලා ආපහු යන්න විදියක් නැති වෙයි නේද'
මා එය ඇසුවේ කටින් නොව ඔහුගේ මුහුණට යොමු කළ දෑසිනි. ඔහුගේ මුහුණේ වෙහෙසකර මද සිනාවක් නැගිණ. සමහර විට ඔහුට සංවාදයේ මාතෘකාව මතක් වෙන්නට ඇත. 'සංවේදී පුරවැසියන් බිහිකර ගැනීමට සාහිත්‍යයෙන් ලැබෙන පිටිවහල'.

''දැන් පටන් ගන්න පුළුවන්. අපි යමු නේද සර්'' සංවිධායකයෙකු සමාව ඉල්ලන හඬකින් අපට සහනය ගෙන ආවේය.
''වැඩි විස්තර නැතුව වැඩේ පටන් ගමු. හුඟක් පරක්කු වුණානෙ''

''ඔව් සර්''

සැරසිලි හේදී ගොස් තිබුණද තරුණ තරුණියන්ගේ මහන්සිය හා උනන්දුව කියාපාන නටඹුන් ඉතිරි වී තිබිණ.

අපි සතුටින් සංවාදය ඇරඹීමු.

සංවාදයක් යයි කීවද වෙනත් සාහිත්‍ය සංවාද සේ ම මෙහිදී ද සම්පත් දායකයන් වන අප දේශකයන් බවට පත් කෙරිණ. අප දෙදෙනා වට දෙකකට කතා කිරීමය සිදුවූයේ. පළමු වටය ආරම්භයේදී රටක යහපත් සමාජයක් ගොඩනැගෙන්නට නම් සංවේදී පුරවැසියන් සිටිය යුතු බවත් මිනිසුන් හැටියට සමාජ සත්වයන් වන අප, අප සමග ජීවත් වන අනෙකාගේ දුක වේදනාව හඳුනා ගත හැකි සංවේදීතාවකින් යුක්ත විය යුතු බවත් අවධාරණය කළෙමි. මගේ පූර්විකාව ජයදේවට එක එල්ලේම නිදසුන්වලට යාමට ඉඩකඩ පාද දුන්නේය. ඔහු පටන් ගත්තේ විමලරත්න කුමාරගම කවියාගේ කවියකිනි. එය ඇසෙන විට මා ගෙදරින් එද්දී සුරැකිව ගෙන ආ වටිනාම දේ ජයදේව සොරාගත්තා නේදැයි මට සිතිණ. මා සිතා සිටියේ ඊළඟ වටයේදී ඒ නිදසුන රස කර කර ඉදිරිපත් කරන්නටය.

'සංහිඳ ළඟ බාරයට කිරි ඉතිරීම
කෙම්මුර දවස්වල පහනින් සැරසීම
කොළඅතු කඩා ගස් දෙබලක දැවටීම
මා නොකෙරුවද නොකෙළෙමි ඒ ගැරහීම'

ජයදේව කවියකු වන නිසා එය කදිමට ගායනා කළේය. 'රෝහලක්, පාසලක් හෝ වෙනත් පහසු කමක් ගව් ගණනක දුරින් වත් නැති වන්නියේ කැලෑබද ගම්වල ජීවත් වන දුප්පත් ජනයා තම දුක් වේදනා කීවේ දෙවියන්ටය. ලෙඩට දුකට අතුරු ආන්තරාවට පිහිට පැතුවේ තමා දන්නා දෙවියන්ගෙනි. ඔවුන් කරන වතාවත් මිත්‍යාව බව කවියා දනී. ඔහු ඒ කිසිවක් නොකරයි. එහෙත් එසේ මිත්‍යා විශ්වාසයේ ගිලී සිටින ජනයාගේ හදවත් හඳුනා ගන්නා කවියා ඔවුන්ට ගර්හා කරන්නේ නැත. ඔහු ඔවුන් කෙරෙහි සංවේදීය.'

ජයදේවගේ පැහැදිලි කිරීම අපේ මාතෘකාවට බෙහෙවින් අදාල යයිද එයින් ප්‍රේක්ෂකයන් තුළ ආකර්ෂණයක් ජනිත වූ බවද මට පෙනිණ. ජයදේව කුමාරගම කවියාගේ 'මිනී කපන මුත් ඒ හේරත්හාමී - ඔහු මට වඩා විසි තිස් ගුණයෙන් දෑමි' යන කවි පද ද ගයා පැහැදිලි කර දුන්නේය.

**මම ඔහුට මා කවුදැයි කීවෙමි. ප්‍රතිචාරය 'හ්ම්' පමණෙකි. දෙපැත්තෙන් ගැසූ හිරිකඩට හොඳින් තෙමී හිඳිමින්ම කාලෙකින් වැස්ස එක හොඳ බව කීවෙමි.**

විදෙස් සාහිත්‍යයෙන් ද නිදසුනක් ගත යුතු යයි සිතූ මම ඇන්ටන් චෙකොව්ගේ කෙටිකතාවක් ගෙනහැර පෑවෙමි. ''මේ කතාවේ එන ප්‍රධාන චරිතය ජීවිකාව සඳහා කුලී අශ්ව කරත්තයක් දක්කන දුප්පතෙක්. වළගොඩැලි සහිත අබලන් පාරවල සීතලේ ගැහෙමින් ඔහු මගීන්ව එහා මෙහා ගෙනියනව. ඔහුගේ කරත්තයෙන් ගමන් කරන බොහෝ දෙනා පොහොසත් ප්‍රභූන්. නැත්නම් සෙල්ලක්කාරයො. ඔවුන් ඔහුට සලකන්නෙ කෲර විදිහට. කරත්තය හෙමින් ගියත් වළක වැටුණත් ඔවුන් පරුෂ වචනයෙන් ඔහුට බැණවදිනව. කතාවෙ කියවෙන ඒ නිශ්චිත දවසෙ කරත්තකරු ඉන්නෙ මහත් චිත්ත පීඩාවකින්. තම දරුවාගේ මරණය නිසා කම්පාවෙන්. ඔහුට තම හිතේ තියෙන දුක වේදනාව කාට හරි කියන්න ඕන. ඔහු තම කරත්තයෙන් ගමන් යන මගීන්ට ඒ දුක කියන්න උත්සාහ කරනව. නමුත් ඔවුන් කිසිවෙක් ඔහුට සවන් දෙන්න සූදානම් නෑ. සමහරු ඔහුට සමච්චල් කරනව. සමහරු බැනවදිනව. දවසේ මෙහෙවර ඉවර කරල ඔහු තමන්ගෙ දුක කියන්නෙ කරත්තෙ අදින අශ්වයට. අශ්වය තමාට සවන් දෙනවා යයි ඔහුට හිතෙනව''.

මෙවැනි නිදසුන් ගණනාවක් ජයදේවත් මමත් ඉදිරිපත් කළෙමු. සවන් දෙන්නන්ගේ උනන්දුව විසින් අපට කාලය අමතක කෙරිණ. එහි ප්‍රතිඵලයක් ලෙස සංවාදය අවසන් වන විට රාත්‍රී දහයමාරද පසුවී තිබුණි. සංවිධායකයන් විසින් සූදානම් කර තිබුණු රාත්‍රී ආහාර වේල ද ප්‍රතික්ෂේප කළ නොහැකි වූයෙන් අප ආපසු එන්නට විශ්වවිද්‍යාල ගේට්ටුවෙන් පිට වූයේ රෑ එකොළහටය. ජයදේවට පිටකොටුව දක්වා යාමටත් මට ගෙදර ඒමටත් ත්‍රීවීලර් රථ දෙකක් නවත්වා ගන්නට තවත් වේලාවක් ගතවිය. මා රථයට ගොඩවැදුනාටත් පසුවද සංවිධායකයෙක් පහත් වී පමාව ගැන සමාව අයැදීය.

''මේ මහත්තයව පරෙස්සමින් එක්ක යන්න ඕන හරිද?'' යයි රියැදුරාට කී ඔහු 'පැයක් වත් යයි නේද සර්'' යයි මගෙන් ඇසුවේය. අඩ අඳුරේ මට ඔහුගේත් රියැදුරාගේත් මුහුණු පෙනුනේ යන්තමිනි.



අපි මොරටුවෙන් පිළියන්දලටත්, එතැනින් කොහුවලටත් කොහුවලින් නුගේගොඩට හැරී නුගේගොඩ නාවල හරහා රාජගිරියට ගොස් එතැනින් බුත්ගමුව පාරේ අයිඩීඑච් හන්දිය පසුකර කොටිකාවත්තටත් යා යුතු බව මම රියැදුරාගේ අඳුරු ඡායාවට කීවෙමි. මගේ මාර්ග විස්තරය ඇසූ ඔහුගේ රථයේ වේගය බාල විය.

අඳුර නිසාද ඔහු කැප් එකක් පැළඳ සිටින නිසාද මට රියැදුරාගේ වයස අනුමාන කළ නොහැකි විය. රථය පදවන වේගය අනුව නම් ඔහු මටත් වඩා වයස්ගත මහල්ලකු විය යුතු යයි මට සිතිණ. වැහි පොදක් ද වැටෙන්නට පටන් ගත්තේය.

පිළියන්දලට එන විට එය දෙපැත්තෙන්ම මගේ ඇඳුම් තෙමෙන වැස්සක් බවට වර්ධනය වී තිබිණ.

''මේකෙ දෙපැත්තෙ ඉටි රෙදිවත් නෑ නේද?'' ඉවසා බැරිම තැන මම ඇසුවෙමි.
''ඔව් සර්, තෙමෙනවද?''
''තෙමෙනව නේන්නං. හයර් දුවනව නං ඒව හයි කර ගන්න එපායැ.''

''වාහනේ මගේ නෙවෙයිනෙ සර්. දවල්ට අයිතිකාරයා දුවනව. හැන්දෑවට තමයි මට හම්බ වෙන්නෙ. හයර් වැදුනත් නැතත් දවසට තුන්සීයක් දෙන්න ඕන''

මම ඉවසාගෙන තෙමුනෙමි.

පිළියන්දලින් හැරී ටික දුරක් එන විට රියැදුරාගේ අත්ෆෝනය හඬන්නට විය. ''මම හයර් එකක් රෑ වෙයි. හ්ම්.... ඇත්තද?.... කඩවල් නං වහල. හ්ම් බලන්නම්''

දුරකථන සංවාදය අතර තුර රථයේ වේගය තවත් බාලවිය. දැන් එය යන්නේ යම්දෝ නොයම්දෝයි දෙගිඩියාවෙන් බව මට වැටහිණ.

''සර්, මම සර්ට වෙන එකක් කතා කරල දෙන්නද?'' රියැදුරාගේ බයාදු කටහඬ මා කුපිත කරන්නට සමත් විය.

''මේ රෑ? මේ වැස්සෙ? ඔයාට පිස්සුද? යං යං. ඔයා පොරොන්දු වුණානෙ මාව ගෙදරට ගෙනියනව කියල. යං යං. ටිකක් හයියෙන් යං.''
''ගෙදරට කෑම එකක් ගෙනියන්ඩ තියෙනව සර්, ඒකයි''
''මේ මිස්ටර් ඒක ඔයා මාව නග්ග ගන්න ඉස්සරින් දැනගන්න එපායැ. කරුණාකරල මාව පොරොන්දු වෙච්ච විදියට ගෙදරට දනව. හා යං යං''

රියැදුරා නිහඬ විය. දෙපැත්තෙන්ම දිගටම හිරිකඩ වදී. රථය ධාවනය වන්නේ මගේ කේන්තිය තවත් අවුස්සන ඉබි ගමනිනි. වෙලාව රෑ එකොළහමාරද පසුවී ඇති බව මගේ අත්ෆෝනයෙන් දැකගතිමි. ගෙදර යන්නට වෙන්නේ හෙටය. කෙසේ වුවද රථයේ වේගය මට යමක් අවබෝධ කරවූයේය. රියැදුරා එය පදවාගෙන යන්නේ බර කල්පනාවකිනි.

කොහුවල හන්දියට කිට්ටු වන විට දෙවන වරට ද රියැදුරාගේ අත්ෆෝනය කෙඳිරිගාන්නට විය.

''ඔව්, හයර් එක ඉවර නෑ. කරන්න දෙයක් නෑ. මම එන කොට තව පැයක් වත් යයි.''

කතා කරන්නේ ඔහුගේ බිරිය බව මට වැටහිණ. ඒ වන විට මා සිටියේ රියැදුරා කෙරෙහි මගේ හැසිරීම ගැන යළි සිතා බලන්නට යොමු වෙමිනි.

''වයිෆ් නේද කතා කරන්නෙ?''
''ඔව් සර්, එයා අසනීපෙන් ඉන්නෙ.''

මට විශ්වවිද්‍යාලයේ සාහිත්‍ය සංවාදයත් මා එහිදී නිදර්ශන ලෙස දැක්වූ චෙකොව්ගේ කතාවත් සිහිපත් වූයෙන් බලවත් ලජ්ජාවක් ඇතිවිය.

එතැන් සිට මා ක්‍රියා කළේ අත්වැරැද්දක් නිසා අමනාප වූ මිතුරෙකු යළි යාළුකර ගන්නට උත්සාහ කරන බොළඳ දරුවකු මෙනි. දරුවා මිතුරාගේ අතින් අල්ලන්නේ චකිතයෙනි. ඔහු වැළඳ ගන්නට තැත් කරන්නේ චකිතයෙනි. මිතුරාගේ ප්‍රතිචාර තරමක් යහපත් වන විට ඔහුට තම සෙල්ලම් බඩු සියල්ලම පෙන්නා කැමති එකක් ගන්නැයි ඉල්ලා සිටියි. හිතට එන හැම කතන්දරයක්ම ඔහුට කියයි. හිනා නොයන දේටත් හඬනගා සිනාසෙයි. ඒක නං මාරයි නේදැයි යාළුවාගෙන් අසයි.

මම ඔහුට මා කවුදැයි කීවෙමි. ප්‍රතිචාරය 'හ්ම්' පමණෙකි. දෙපැත්තෙන් ගැසූ හිරිකඩට හොඳින් තෙමී හිඳිමින්ම කාලෙකින් වැස්ස එක හොඳ බව කීවෙමි. මා මොරටු ආවේ කුමකටදැයි කීවෙමි. අප කළ සංවාදයේ මාතෘකාව ගැන නොකීවෙමි.

ත්‍රී රෝද රථය ඉන්ධන ලබා ගැනීම සඳහා ඉන්ධන හලක නැවැත්වූ විට මම බලහත්කාරයෙන් රියැදුරාට මුදල් දුන්නෙමි. ''ඕන නෑ සර්, මා ළඟ තියෙනවා'' යයි කියන විට ඔහුගේ මුහුණ හරි හැටි දුටුවෙමි. තරුණ විය යන්තම් ඉක්මවමින් සිටින්නෙකි ඔහු.

''තව කොච්චර දුරද සර්?'' රථය යළි පනගන්වමින් ඔහු ඇසුවේය.
''විනාඩි විස්සක් විතර යයි''

ඔහු දිගටම කල්පනාවේය. මම දිගටම කියෙව්වෙමි. ඒ කිසිවක් අසන්නාට අදාල නැති බව පෙනේ.

''මමත් ටිකක් අසනීපෙන් ඉන්නෙ'' මා කීවේ දුර්වල කඩහඬක් මවාගනිමිනි.

මගේ අසනීපය කුමක්දැයි ඔහු නොඇසුවෙන් මා ඊ ළඟට අසන්නට සූදානමින් සිටි ප්‍රශ්නය යටපත් කර ගන්නට මට සිදුවිය. එහෙත් ගෙදරට යන තුරුම මගේ සිතේ ඒ සම්බන්ධයෙන් නොයෙකුත් සිතිවිලි පැටලෙමින් තිබිණ.

ඔහුගේ බිරිය ඊයේ පෙරේද දරුප්‍රසූතියකට මුහුණ දුන්නේද? දරුණු මානසික රෝගයක්ද? පිළිකාවක්ද? ඒ කුමක් හෝ විය හැකිය. ප්‍රශ්නය ඇසීමෙන් ඔහුගේ සිත තවත් රිදෙනු ඇතැයි සිතූ මම රියෙන් බසින විට 'මට ඔයාගෙ ප්‍රශ්නෙ හොඳට තේරුණා. ඒත් මමත් මේ රෑ කොහොමහරි ගෙදර එන්න ඕන නේ' යයි කියන්නෙමියි සිතමින් නිහඬව ආවෙමි.

එහෙත් මා රථයෙන් බසින විට මගෙන් කියැවුනේ ''බොහොම ස්තූතියි'' යන්න පමණෙකි.